සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD

සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම සේවක සංඛ්‍යා තනතුරු පුරවනු ලබන්නේ කොළඹ පිහිටි ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම (PMT) සඳහා පමණක් බව කරුණාවෙන් සලකන්න.

අංකය	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	සුදුසුකම්
01	**ප්‍රසම්පාදන නිලධාරී** වැටුප් කේතය: F කාණ්ඩය (02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)	01	(පහත විකල්ප 1 හෝ 2 හෝ 3) **විකල්ප 1** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් / උපාධියකට සමාන සුදුසුකමක් **හෝ** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක්; **සහ** අදාළ විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද **විකල්ප 2** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක්; **සහ** අදාළ විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද **විකල්ප 3** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක්; **සහ** අදාළ විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද
02	**ව්‍යාපෘති නිලධාරී (මූල්‍ය/ගිණුම්කරණ)** වැටුප් කේතය: F කාණ්ඩය (02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)	01	**(පහත විකල්ප 1 හෝ 2 හෝ 3)** **විකල්ප 1** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් / උපාධියකට සමාන සුදුසුකමක් **හෝ** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව,නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක්; **සහ** අදාළ විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද. **විකල්ප 2** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 6 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක්; **සහ** අදාළ විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද. **විකල්ප 3** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් මගින් තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක්; **සහ** අදාළ විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08ක පළපුරුද්ද.

සටහන: සුදුසුකම් සහ තාවකාලික යොමු අනුදේශයන් (TORs) පහත වෙබ් අඩවිවලින් ලබාගත හැකිය:

https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies

https://www.wbb.gov.lk

තෝරාගැනීමේ ක්‍රමවේදය:

සුදුසුකම් සහ පළපුරුද්ද මත තෝරාගනු ලබන කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

බඳවා ගැනීමේ පදනම:

බාහිර අයදුම්කරුවෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහු/ඇය අදාළ තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ; රාජ්‍ය සේවකයෙකු තෝරාගනු ලැබුවහොත්, ඔහු/ඇය අනුයුක්ත කිරීමේ පදනම මත බඳවා ගනු ලැබේ.

මාසික වේතනය:

F කාණ්ඩය - රු. 150,000/- + රජය විසින් අනුමත කරන ලද දීමනා

නියමයන් සහ කොන්දේසි:

පත්වීම් මුලින් 2027 සැප්තැම්බර් 30 වන දින දක්වා කාලසීමාවක් සඳහා සිදු කරනු ලබන අතර, ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කිරීම සහ නිලධාරියාගේ සතුටුදායක කාර්යසාධනය මත පදනම්ව එය අලුත් කළ හැකිය. 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ සහ ඊට පසු නිකුත් කරන ලද චක්‍රලේඛවල සඳහන් සියලුම කොන්දේසි මෙම පත්වීම් සඳහා අදාළ වේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් වයස අවුරුදු 64ට අඩු විය යුතුය.

අයදුම්පත්‍රය පහත වෙබ් අඩවිවලින් බාගත කරගත හැකිය:

https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies

https://www.wbb.gov.lk

නියමිත ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්, 2026 දෙසැම්බර් 03 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම, පෞද්ගලිකව ගෙනැවිත් භාරදීම හෝ **dpd.spp.wbb@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කිරීම කළ යුතුය. රාජ්‍ය/සංස්ථාපිත අංශයේ ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, විද්‍යුත් තැපැලෙන් අයදුම් කරන්නේ තම විෂය නිරුවේ සඳහන් කළ යුතුය. මෙම දැන්වීම අවලංගු කිරීමට, සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට මෙන්ම අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුව බලය ඇත.

සභාපති / කොමසාරිස් / ව්‍යාපෘති අධ්‍යක්ෂ,
සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය,
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය,
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය,
අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED